රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 12/2012(I)

මගේ අංකය : EST-1/CIRL/03/0001
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2023.06.11

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතු කරුණු හා ඒවා ඉදිරිපත් කළ යුතු ආකාරය**

ඉහත කරුණ සම්බන්ධයෙන් 2012.09.17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2012 කෙරෙහි අවධානය යොමු කරවමි.

02. එම චක්‍රලේඛය මගින් ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු කරුණු, ඉදිරිපත් නොකළ යුතු කරුණු සහ යම් ගැටලුවක් ඉදිරිපත් කරන්නේ නම්, ඉදිරිපත් කළ යුතු ආකාරය පිළිබඳව දැනුම්වත් කර තිබුණ ද, බොහෝ අවස්ථාවල ඒ කෙරෙහි අවධානයක් යොමු නොකරමින් කටයුතු කරන ලද අවස්ථා නිරීක්ෂණය කරන ලද අතර ඒවායින් සමහරක් පහත පරිදි වේ.

I. ගැටලුව නිසි පරිදි හඳුනානොගෙන, අධ්‍යයනය කිරීමකින් තොරව ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීම

II. ආයතන සංග්‍රහයේ පැහැදිලි වශයෙන් ම විධිවිධාන දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් ම නැවත නැවත ආයතන විසින් විමසීම් කිරීම

III. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති මගින් ආවරණය වන කරුණු සම්බන්ධයෙන් මෙන් ම අදාළ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හෝ අමාත්‍ය මණ්ඩලය විසින් ගෙන ඇති හෝ ගත යුතු ප්‍රතිපත්තිමය තීරණවලට අදාළව උපදෙස් විමසීම

IV. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙතින් විමසිය යුතු ව්‍යවස්ථාපිත ආයතනවලට අදාළ ගැටලු සම්බන්ධයෙන් විමසීම් කිරීම

V. රජයේ නිලධරයන් විසින් ලිපි සහ අභියාචන යොමු කිරීමේ දී රජයේ නිලධරයන් විසින් නියෝජනයන් ඉදිරිපත් කළ යුතු ආකාරය දැක්වෙන ආයතන සංග්‍රහයේ XXVIII වැනි පරිච්ඡේදයේ 5 වගන්තියේ විධිවිධාන අනුව කටයුතු නොකරනු ලබන අවස්ථා

03. එලෙස 2012.09.17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2012 හි විධිවිධානවලට අනුව කටයුතු නොකිරීම නිසා අවධානය යොමුකළ යුතු අත්‍යවශ්‍ය ම කාරණා සම්බන්ධයෙන් වැය කළ යුතු කාලය සීමා වන අතරම අනවශ්‍ය ලෙස සම්පත් නාස්තිය හා ප්‍රමාදවීම් සිදුවීම හේතුවෙන් අදාළ ගැටලුවට පාත්‍ර වී සිටින රජයේ නිලධරයන් මහත් අපහසුතාවට පත් වේ.

04. එබැවින්, 2012.09.17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2012 හි විධිවිධාන කෙරෙහි අවධානය යොමුකරමින් කටයුතු කිරීම සඳහා ඔබ යටතේ පවතින ආයතන ප්‍රධානීන් දැනුම්වත් කිරීම මැනවි. එසේ කටයුතු නොකරන අවස්ථාවලට අදාළව ඇති වන ගැටලුකාරී තත්ත්වයන් සම්බන්ධයෙන් ආයතන අධ්‍යක්ෂ ජනරාල් වගකීමට බැඳී නොසිටින බව ද අවධාරණය කරමි.

කේ.ඩී.එන්. රංජිත් අසෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 0112662340
ෆැක්ස් : 0112692158
විද්‍යුත් ලිපිනය : ade-i@pubad.gov.lk